**මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය ) III - 2016**

---

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය ) **III** අදියර 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීන ආනයන හා අපනයන බැංකුව සමග 2014 සැප්තැම්බර් 16 දිනැති ඇතුලත් වූ අංක පීබීසී(2014) 15 එකතු අංක (309) දරන ණය ගිවිසුම යටතේ ක්‍රියාත්මක කරන ලදී.

**1.2 <u>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය</u>**

ව්‍යාපෘති ණය ගිවිසුමට අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, කොළඹ ප්‍රධාන නගරයේ ප්‍රවාහන තදබදය අඩු කිරීමට හා රටේ අනිකුත් ප්‍රදේශවලට සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා දක්ෂිණ අධිවේගී මාර්ගයට සහ කොළඹ නගරයෙන් පිටතට යන අනෙකුත් ජාතික මාර්ගවලට සම්බන්ධ කෙරෙන කොළඹ නගරයෙන් බැහැර අධිවේගී මාර්ගයක් ඉදිකිරීම තුලින් ශ්‍රී ලංකාවේ පලාත් අතර ආර්ථික සංවර්ධන ශක්තිමත් කිරීමට දායක වීමය. ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 76,200 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 590 ක් වූ අතර ඉන් රු.මිලියන 63,356 කට සමාන එ.ජ.ඩො. මිලියන 494 මූල්‍යායනය කිරීමට චීන ආනයන හා අපනයන බැංකුව එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 අගෝස්තු ආරම්භ කර තිබුණු අතර 2019 ජූනි වන විට අවසන් කිරීමට අපේක්ෂිතය.

**1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 <u>විගණකගේ වගකීම</u>**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකණු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමණාකරනය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් හා ණය දෙන ආයතන වලින් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 <u>තත්වාගණන විගණන මතය සඳහා පදනම</u>**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරණු ලැබේ.

**2. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**2.1 <u>මතය</u>**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු.**

විගණනයේදී පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රු. මිලියන 871.66ක් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය රඳවාගත් මුදල් රු. මිලියන 168.19 ක් මූල්‍ය ප්‍රකාශන වල ගෙවියයුතු ලෙස පෙන්නුම් කිරීම වෙනුවට සිහිවටන පදනම මත වර්ගීකරණයකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ පෙන්නුම්කරන කෙරීගෙන යන වැඩ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරුවන්ට සිදුකළ වැඩ පූර්ව අත්තිකාරම් රු. මිලියන 10,054.18 ක් වෙනම පෙන්නුම් කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ පෙන්නුම්කර තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂයේ අයවැය ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුල හා 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් දත්ත සමහරක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය කිරීමට එකග වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | අරමුදල් උපයෝජනය 2016 වර්ෂය තුල | | අරමුදල් උපයෝජනය 2016 දෙසැම්බර් 31 දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| එක්සිම් බැංකුව | 494 | 63,356 | 8,000 | 47 | 6,957 | 60 | 8,885 |
| ශ්‍රී.ලං.ර | 96 | 12,844 | 1,700 | 11 | 1,592 | 60 | 8,807 |
| එකතුව | 590 | 76,200 | 9,700 | 58 | 8,549 | 120 | 17,692 |

**3.2 භෞතික ප්‍රගතිය**

සිවිල් වැඩ වලට අදාල කොන්ත්‍රාත්කරු 2014 අගෝස්තු 25 දින වැඩ ආරම්භකර තිබූ අතර උපදේශන කටයුතු ඊට මාස 2කට පසු එනම් 2014 ඔක්තෝබර් 13 දින ආරම්භකර තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 10.35ක් අපේක්ෂිත වූ අතර ඊට එරෙහිව සියයට 9.5 ක්ව පැවතුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුමට අදාල තාක්ෂණික පිරිවිතර 503.4 ඡේදයට අනුව වානේ කම්බි වරගැන්වීම්වල ඇතුලත කොටස හා පිටත මුහුනත අතර උෂ්ණත්ව වෙනස්වීම් සෙන්ට්‍රිග්‍රේඩ් 20 නොඉක්ම විය යුතුය. කෙසේ වෙතත් තත්වාරක්ෂණ වාර්තා අනුව Pile caps 11ක උෂ්ණත්ව වෙනස්වීම්. ඉහත පිරිවිතරයන් ඉක්මවා තිබුණු ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් කරන ලද පැහැදිලිකිරීම් වලට අනුව ව්‍යූහාත්මක ජාමිතික

ඉංජිනේරු (Structure Design Engineer) විශ්ලේෂණ හරහා පදනම්ව විචලනයට එකඟවූ අතර වානේ කම්බි වරගැන්වීම් සිදුකර ඇති නිසා උෂ්ණත්ව වෙනස්වීම් සෙන්ට්‍රිග්‍රේඩ් 30 දක්වා නොවෙනස්ව තැබීමට තීරණය කරන ලදී. එම නිසා අදාල වැඩ කොටසේ වැදගත්කම නිසා ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත්කරුගේ අවධානමට යටත්ව අඛණ්ඩව කරගෙන යාමට ඉඩදෙන ලදී.

(ආ) සංශෝධිත ඉදිකිරීම් වැඩ සටහන අනුව කොන්ත්‍රාත්කරු 2017 ජනවාරි අවසානයට Void Beam 426 සකස්කිරීම අවසන්කළ යුතුය. කෙසේවෙතත් කොන්ත්‍රාත්කරු Void Beam 246ක් පමණක් 2017 ජනවාරි 31ට සකස්කිරීම් කර තිබුණි.

(ඇ) අධිවේගී මාර්ගයේ ස්ථාන 5ක් හරහා ඇති අධිශක්ති විදුලි රැහැන් වෙනස් කිරීම සඳහා රු. මිලියන 120 ක් ගෙවා ඇතත් එම විදුලි රැහැන් වෙනස් කිරීමට කිසිදු ඵලදායී ක්‍රියාමාර්ගයක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2016 දෙසැම්බර් 31 දක්වා ගෙන නොතිබුණි. ඒවායේ ප්‍රමාදය මාර්ග සංවර්ධන වැඩ වලට සෘණ බලපෑමක් වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඈ) මහර මුදුන්ඇළ හැරීමේ කොන්ත්‍රාත්තුව රු. මිලියන 8.70 කට ශ්‍රී ලංකා පහත්බිම් සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙන විචලන නියෝගයක් යටතේ ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත්කරු අදාල වැඩ රු. මිලියන 3.34කට නිමකර තිබුණු අතර ඒ හේතුවෙන් කොන්ත්‍රාත්තුව තාත්වික නොවූ අතර වැඩියෙන් දක්වා ඇති බව අනාවරණය විය. මේ සම්බන්ධව වැඩිපුර ගෙවා ඇති රු. මිලියන 5.36 සංස්ථාව විසින් විධිමත් ගිවිසුමකින් තොරව කරගෙන යන ජල විද්‍යාත්මක අධ්‍යයනය සඳහා වූ උපදේශන ගාස්තු ලෙස ගෙවියයුතු රු. මිලියන 7.36 ක ගාස්තුවට හිලව්කර ඇත.

(ඉ) විදේශීය උපදේශන කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ජ්‍යෙෂ්ඨ භූවිද්‍යාත්මක ඉංජිනේරුවකු මාස 7ක සේවයේ යෙදීම අවශ්‍යය. කෙසේවෙතත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවකු අර්ධ කාලීනව හා කණිෂ්ඨ ඉංජිනේරුවකු පූර්ණ කාලීනව මසකට රු. 584.000 ක පිරිවැයකට යෙදවීමට සැලසුම් කර තිබුණි.

**3.4 <u>ඉඩම් අත්පත් කරගැනීම් සහ නැවත පදිංචි කිරීමේ කටයුතු</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබී ඇති තොරතුරු අනුව, ව්‍යාපෘතිය ඉඩම් කැබලි 1267 ක් අත්පත්කර ගෙන තිබූ අතර ඉන් ඉඩම් කැබලි 142 ක් 2017 පෙබරවාරි 28 දින වන විට ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ලියාපදිංචි කර තිබුණි. අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම් ප්‍රමාදය හේතුවෙන් රු. මිලියන 219.47 පොලී වශයෙන් ගෙවා තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. නැවත පදිංචි කිරීමේ කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් වැඩබිමේ නේවාසික වූ පවුල් 60ක් ඉන් ඉවත්කර ගැනීමට නොහැකි වූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) ජයසුමන වත්ත නැවත පදිංචි කිරීමේ වැඩබිම සංවර්ධනය කිරීමට පුද්ගලික අංශයට රු. මිලියන 5.34 ක කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණු අතර කොන්ත්‍රාත්තු ගිවිසුමේ වැඩ නිමකළ යුතු දිනය නිශ්චය කර නොතිබුණි. කෙසේවෙතත් සංවර්ධන වැඩ 2017 මාර්තු 20 දින දක්වා සම්පූර්ණකර නොතිබුණි.

(ඇ) ලැබී ඇති තොරතුරු අනුව මිල්ලගහවත්ත හෙක්ටයාර් 2.6348 වූ නැවත පදිංචිකිරීමේ වැඩබිමේ සංවර්ධන කටයුතු 2014 අප්‍රේල් වන විට සම්පූර්ණ කර තිබුණි. කෙසේවෙතත් මුලු ඉඩම් කැබලි 72න් ඉඩම් කැබලි 15 අවතැන් වූ ජනතාවගේ ඉල්ලුම් කිරීමක් නොමැතිවීම හේතුවෙන් නිෂ්ක්‍රීයව පැවතුණි.

**3.5 <u>මතභේදයට තුඩුදෙන කරුණු</u>**

තාක්ෂණික පිරිවිතර 504.2.1 අනුව වැර ගැන්වූ වානේ කම්බි බ්‍රිතාන්‍ය ප්‍රමිත 4449ට අනුකූල විය යුතුය. එම ප්‍රමිතියට දේශීය නිෂ්පාදිත වානේ කම්බි අඩු මිලට ප්‍රසම්පාදනය කිරීමේ හැකියාව නොවිමසා ව්‍යාපෘතිය රු. මිලියන 266.14කට Alloy hot rolled deformed වානේ

කි.ග්‍රෑම් 4,727,985 ක් ආනයනය කිරීමට ඉඩදී තිබුණු අතර ඉන් ආනයන බදු සඳහා වැයකල රු. මිලියන 82.44 ඉතිරිකර ගැනීමට හැකියාව තිබුණි.

**3.6 <u>මානව සම්පත් කළමනාකරණය</u>**

ව්‍යාපෘතියේ අනුමත සේවක සංඛ්‍යා කාර්ය මණ්ඩල සාමාජිකයන් 34 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් ඉංජිනේරුවරු 03, නැවත පදිංචි කිරීමේ නිලධාරී, කාර්මික නිලධාරී හා නැවත පදිංචි කිරීමේ සහයක යන තනතුරු 2016 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වී තිබුණි. කෙසේවෙතත් අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා සුලු සේවක ශ්‍රේණියේ 14 දෙනෙකු බඳවාගෙන තිබු අතර ඔවුන්ට රු. මිලියන 1.95ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.